මගේ අංකය : JSC/SEC/CIR/2022

සියලුම කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් වෙත,

**<u>කාර්මික ආරවුල් පනතේ 46 වගන්තිය.</u>**

2010.08.05 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 327 නිකුත් කර තිබියදීත් හා ඉන්පසුවද එම චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකිරීමේ වැදගත්කම අවධාරණය කර තිබියදීත්, තවදුරටත් එම චක්‍රලේඛයේ ප්‍රතිපාදන උල්ලංඝනය වන බවට අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත වාර්තා වී තිබීම සැළකිල්ලට ගත් අධිකරණ සේවා කොමිෂන් සභාව, එකී 2010.08.05 දිනැති 327 චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුවම ක්‍රියාකළ යුතු බව තරයේ ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

02. එකී 327 චක්‍රලේඛයෙහි පිටපතක්ද, එකී චක්‍රලේඛය නැවත ඔබගේ අවධානයට ලක් කිරීමට අදාල මගේ අංක JSC/SEC/CIR/2019 දරන 2019.10.23 දිනැති ලිපියේ පිටපතක් ද මේ සමඟ අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එස්. සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 මැයි මස 27 වන දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ANNEXE A - (28)

අධිකරණ සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ අංක - 327

මගේ අංකය - ජේඑස්සී/එස්ජ්සී/සීඅයිආර්/2010

සියළුම කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් වෙත,

<u>කාර්මික ආරවුල් පනතේ 46 වගන්තිය</u>

සමහර කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් කාර්මික ආරවුල් පනතේ 46 වගන්තියේ ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් වෘත්තීය සමිති නිලධාරීන්ට පාර්ශවකරුවන්ගේ නියෝජිතයන් ලෙස පෙනී සිටීමේ අයිතිය අහිමිකර ඇති බව අධිකරණ සේවා කොමිෂන් සභාව අවස්ථා කිහිපයකදී නිරීක්ෂණය කර ඇත.

2. ඒ අනුව කාර්මික ආරවුල් පනතේ 46 වගන්තියේ ප්‍රතිපාදන නිසි පරිදි අනුගමනය කරන ලෙස ඔබට දන්වන මෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව මට නියම කර ඇත.

මංජුල තිලකරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
නියෝජ්‍ය ලේකම්

මංජුල තිලකරත්න
නියෝජ්‍ය ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2010 අගෝස්තු මස 5 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

මගේ අංකය: JSC/SEC/CIR/2019

සියළුම කම්කරු විනිශ්වය සභා සභාපතිවරුන් වෙත,

<u>කාර්මික ආරවුල් පනතේ 46 වගන්තිය</u>

ශීර්ෂගත කරුණට අදාලව කම්කරු විනිශ්වය සභා වෘත්තීය වේදී සංගමයේ ලේකම් විසින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යවන ලදුව එමගින් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙතත් එමගින් මා වෙතත් යොමු කර ඇති 2019.07.01 දිනැති ලිපිය පිළිබඳ සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් 2010.08.05 දිනැතිව නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 327 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන ලෙස මට නියම කර ඇත.

එම චක්‍රලේඛයෙහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

එච්. සංජීව සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2019 ඔක්තෝබර් මස 23 වෙනි දින

කොළඹ 12

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.